ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2015 මාර්තු මස 24 වැනි දින |

## 2015 ජනවාරි මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

### සමස්ත නිරීක්ෂණ

2015 ජනවාරි මාසයේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය තවදුරටත් ස්ථාවරව පැවතුණි. වෙළඳ හිඟය සුළු වශයෙන් වැඩිවීම හමුවේ වුවද විදේශීය අංශයේ ශක්තිමත්භාවය සඳහා ගෙවුම් තුලනයේ ජංගම ගිණුම මෙන්ම මූල්‍ය ගිණුම වෙත වූ විදේශ මුදල් ලැබීම් ආයක විය. ආනයන වියදමෙහි අපේක්ෂිත අඩු වීම, සංචාරක හා විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ආකාරයෙන් මෙන්ම රජය, බැංකු අංශය සහ අනෙකුත් පෞද්ගලික අංශය වෙත වූ ඉහළ ලැබීම් හේතුවෙන් වසර තුළ දී විදේශීය අංශය තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### අපනයන ක්‍රියාකාරිත්වය

2015 ජනවාරි මාසයේ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 910 ක් දක්වා සියයට 0.6 කින් සුළු වශයෙන් වර්ධනය වූ අතර, කාර්මික අපනයන ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මුළු අපනයනවලින් සියයට 77 ක් පමණ වූ කාර්මික අපනයන, ප්‍රධාන වශයෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ, සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් අපනයනයන්හි වර්ධනය හේතුවෙන් සියයට 0.9 කින් සුළු වශයෙන් ඉහළ ගියේය. 2015 ජනවාරි මාසයේ දී නැව් සහ ගුවන් යානා සඳහා භාවිතා කරන ඉන්ධනවල මිල ගණන්

අඩු වුවද, අපනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් ඛනිජතෙල් නිෂ්පාදිත අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 56 ක් දක්වා සියයට 67.3 කින් වර්ධනය විය. 2015 ජනවාරි මාසයේ දී ප්‍රධාන වශයෙන් විදුලි යන්ත්‍ර සහ උපකරණ අපනයන ඉහළ යෑම හේතුවෙන් යන්ත්‍රසූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 27 ක් දක්වා සියයට 15.6 කින් වර්ධනය වූ අතර, පාවහන් අපනයන විශාල වශයෙන් ඉහළ යෑම හේතුවෙන් සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ සහ පාවහන් අපනයන එ.ජ.ඩොලර් මිලියන 15 ක් දක්වා සියයට 70.6 කින් වර්ධනය විය. කෙසේ වුවද, ආහාර, පාන වර්ග හා දුම්කොළ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 21 ක් දක්වා සියයට 44.4 කින් අඩු වූ අතර, ශල්‍ය අත්වැසුම් සහ අනෙකුත් අත්වැසුම් අපනයන වර්ධනය වුවද, රබර් ටයර් අපනයන අඩු වීම හේතුවෙන් රබර් නිෂ්පාදිත අපනයන එ.ජ.ඩොලර් මිලියන 64 ක් දක්වා සියයට 12.3 කින් අඩු විය. මේ අතර, සාම්ප්‍රදායික සහ සාම්ප්‍රදායික නොවන වෙළඳපොළවල් වෙත කළ ඇඟලුම් අපනයන පහත වැටීම පිළිබිඹු කරමින් රෙදිපිළි සහ ඇඟලුම් අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 410 ක් දක්වා සියයට 0.5 කින් සුළු වශයෙන් අඩු විය.

**මේ අතර, කෘෂිකාර්මික අපනයන ආදායම සියයට 0.6 කින් සුළු වශයෙන් පහත වැටුණු අතර ජාත්‍යන්තර වෙළඳපොළ භාණ්ඩ මිල ගණන් අඩු වීම මේ සඳහා හේතු විය.** තේ අපනයන පරිමාව සියයට 11.9 කින් වර්ධනය වුවද, මිල ගණන් පහළ යෑම හේතුවෙන් තේ අපනයන ආදායම සියයට 2.2 කින් අඩු විය. 2013 ජූලි මාසයේ සිට කැපී පෙනෙන වර්ධනයක් පෙන් වූ පොල් නිෂ්පාදිත අපනයන ආදායම 2015 ජනවාරි මාසයේ දී අඩු වූ අතර, පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත අපනයන පහත වැටීම මේ සඳහා හේතු විය. තවද, 2015 ජනවාරි මාසයේ දී මුහුදු ආහාර අපනයන ආදායම තවදුරටත් අඩු විය. කෙසේ වුවද, කුරුඳු සහ ගම්මිරිස් වැනි ඇතැම් කාණ්ඩවල මිල ගණන් සහ පරිමාවන් ඉහළ යෑම හේතුවෙන් කුළුබඩු අපනයන ආදායම සියයට 73.8 කින් වර්ධනය වූ අතර 2014 වසරේ අනුරූප මාසය සමඟ සැසඳීමේ දී සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයනය ද වර්ධනය විය.

සංඛ්‍යා සටහන 1: අපනයන ආදායම

| කාණ්ඩය | 2014 ජනවාරි (එ.ජ.ඩො. මිලියන) | 2015 ජනවාරි (එ.ජ.ඩො. මිලියන) | වර්ධනය (සියයට) |
|---|---|---|---|
| 1. **කාර්මික අපනයන** | **697.5** | **703.8** | **0.9** |
| රෙදිපිළි හා ඇඟලුම් | 412.0 | 409.9 | -0.5 |
| රබර් නිෂ්පාදිත | 73.2 | 64.2 | -12.3 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 44.5 | 43.2 | -2.8 |
| ප්‍රවාහන උපකරණ | 7.0 | 6.7 | -5.5 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ_ | 23.6 | 27.2 | 15.6 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 33.2 | 55.5 | 67.3 |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 38.1 | 21.2 | -44.4 |
| වෙනත් | 66.0 | 75.9 | 15.1 |
| 2. **කෘෂිකාර්මික අපනයන** | **203.2** | **202.0** | **-0.6** |
| තේ | 116.1 | 113.5 | -2.2 |
| පොල් | 22.5 | 19.2 | -14.7 |
| මුහුදු ආහාර | 21.7 | 16.6 | -23.8 |
| කුළුබඩු | 17.9 | 31.1 | 73.8 |
| වෙනත් | 24.9 | 21.6 | -13.4 |
| 3. **ඛනිජ වර්ග සහ වෙනත්** | **3.2** | **4.0** | **25.0** |
| **මුළු අපනයන** | **903.9** | **909.8** | **0.6** |

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා වෙනත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

## ආනයන ක්‍රියාකාරිත්වය

**2015 ජනවාරි මාසයේ දී ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 1,682 ක් දක්වා සියයට 1.6 කින් සුළු වශයෙන් වර්ධනය වූ අතර, පාරිභෝගික භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයනවල වර්ධනය ඉන් පිළිබිඹු විය.** ආනයන වර්ධනය වීම සඳහා ප්‍රධාන වශයෙන් පාරිභෝගික භාණ්ඩ ආනයන දායක වූ අතර, ඒ සඳහා සහල් ආනයන සහ පෞද්ගලික රථ වාහන ආනයන ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. 2014 අප්‍රේල් මාසයේ සිට පැවති වර්ධනය වීමේ ප්‍රවණතාවය තවදුරටත් පෙන්නුම් කරමින් සහල් ආනයන වියදම 2014 ජනවාරි මාසයේ වූ එ.ජ.ඩොලර් මිලියන 1.6 ට සාපේක්ෂව 2015 ජනවාරි මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 55 ක් දක්වා වර්ධනය වූ අතර, දේශීය නිෂ්පාදනය පහත වැටීම මේ සඳහා හේතු විය. මේ අතර, රථවාහන සඳහා වූ ආනයන තීරු බදු ව්‍යුහයේ වෙනස්වීමේ බලපෑම සහ ජපාන යෙන්වල අගය අවප්‍රමාණය වීම හේතුවෙන් පෞද්ගලික රථවාහන ආනයනය සියයට 115.8 කින් වර්ධනය විය. බස් රථ ආනයනයන්හි කැපී පෙනෙන වර්ධනයත් සමඟ ප්‍රවාහන උපකරණ ආනයන ඉහළ යෑම, ආයෝජන භාණ්ඩ ආනයන වර්ධනය වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ඉංජිනේරු උපකරණ ආනයන මගින් ලද ඉහළ

දායකත්වයත් සමඟ යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම ද සැලකිය යුතු ලෙස වර්ධනය විය. මේ අතර, ප්‍රධාන වශයෙන් ඉන්ධන ආනයනය සඳහා වූ වියදම අඩු වීම හේතුවෙන් අන්තර් භාණ්ඩ ආනයන සියයට 18.7 කින් අඩු විය. බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිතවල මිල ගණන් සහ පරිමාවන් අඩු වීම හේතුවෙන් ඉන්ධන ආනයන වියදම සියයට 41.1 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. අන්තර් භාණ්ඩ ආනයන වියදම් අඩු වීම සඳහා තිරිඟු හා ඉරිඟු සහ ඛනිජමය නිෂ්පාදිත ආනයන වියදම අඩු වීම ද ප්‍රධාන ලෙස දායක විය. කෙසේ වුවද, පොහොර මිල ගණන් අඩු වුවද, ආනයන පරිමාවන් විශාල වශයෙන් ඉහළ යෑම හේතුවෙන් පොහොර ආනයන වියදම කැපී පෙනෙන ලෙස වර්ධනය විය. මූල ලෝහ සහ රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම් ද සැලකිය යුතු ලෙස වර්ධනය විය.


.


**සංඛ්‍යා සටහන 2: ආනයන වියදම**

| කාණ්ඩය | 2014 ජනවාරි (එ.ජ.ඩො. මිලියන) | 2015 ජනවාරි (එ.ජ.ඩො. මිලියන) | වර්ධනය (සියයට) |
|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **253.6** | **397.3** | **56.7** |
| ආහාර හා පාන වර්ග | 109.9 | 169.5 | 54.3 |
| සහල් | 1.6 | 55.0 | 3,418.1 |
| කිරි නිෂ්පාදිත | 38.2 | 14.5 | -62.2 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 70.1 | 100.1 | 42.8 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 143.7 | 227.8 | 58.5 |
| රථවාහන | 46.1 | 99.5 | 115.8 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 32.2 | 36.6 | 13.8 |
| අනෙකුත් ආහාරමය නොවන | 65.4 | 91.7 | 40.2 |
| **2. අන්තර් භාණ්ඩ** | **1,034.8** | **841.6** | **-18.7** |
| ඉන්ධන | 491.2 | 289.2 | -41.1 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 193.6 | 200.0 | 3.3 |
| රසායනික නිෂ්පාදිත | 68.5 | 74.5 | 8.8 |
| ප්ලාස්ටික් හා උපාංග | 51.8 | 50.8 | -2.0 |
| මූල ලෝහ | 32.4 | 49.5 | 52.8 |
| කඩදාසි සහ ඝන කඩදාසි | 35.7 | 38.4 | 7.6 |
| තිරිඟු හා ඉරිඟු | 39.8 | 21.3 | -46.5 |
| පොහොර | 3.5 | 10.1 | 188.3 |
| වෙනත් | 118.3 | 107.9 | -8.8 |
| **3. ආයෝජන භාණ්ඩ** | **366.3** | **441.8** | **20.6** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 196.9 | 240.6 | 22.2 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 121.9 | 109.1 | -10.5 |
| ප්‍රවාහන උපකරණ | 47.2 | 91.1 | 93.2 |
| වෙනත් | 0.3 | 1.0 | 257.1 |
| **මුළු ආනයන** | **1,655.5** | **1,681.6** | **1.6** |

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 1: අපනයන සහ ආනයන ක්‍රියාකාරිත්වය**




**වෙළඳ ශේෂය**

**2015 ජනවාරි මාසයේ දී වෙළඳ හිඟය 2014 ජනවාරි මාසයේ දී වාර්තා කළ එ.ජ.ඩොලර් මිලියන 752 ට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 772 ක් දක්වා පුළුල් විය.**

**සංචාරක ඉපැයීම්**

**2015 ජනවාරි මාසයේ දී සංචාරක පැමිණීම් 2014 ජනවාරි මාසයේ දී වූ 146,575 සිට 156,246 දක්වා සියයට 6.6 කින් වර්ධනය විය.** 2015 ජනවාරි මාසය තුළ දී ඉන්දියාව, එක්සත් රාජධානිය, චීනය, ජර්මනිය සහ රුසියාව සංචාරකයින් පැමිණෙන ප්‍රධාන මූලාශ්‍ර පහ වූ අතර, එම මාසය තුළ දී සිදු වූ මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 43.3 කට පමණ මෙම මූලාශ්‍ර දායක විය. 2015 වසරේ ජනවාරි මාසයේ දී සංචාරක ඉපැයීම්[1] 2014 ජනවාරි මාසයේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 233.3 සිට එ.ජ.ඩොලර් මිලියන 248.7 දක්වා සියයට 6.6 කින් වර්ධනය වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**

**2015 ජනවාරි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ පෙර වසරේ අනුරූප කාල පරිච්ඡේදයේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 555.5 සිට සියයට 5.8 ක ප්‍රමාණයකින් අඩු වෙමින් එ.ජ.ඩොලර් මිලියන 523.5 ක මට්ටමේ පැවතුණි.** 2014 දෙසැම්බර් මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 708.8 ක ඉහළ ලැබීම්වලට අනතුරුව මෙම අඩුවීම වාර්තා විය. කෙසේ වෙතත්, අලුත් අවුරුදු උත්සව සමය තුළ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

---

1 තාවකාලික ඇස්තමේන්තු වන අතර, 2015 වසර සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ඇස්තමේන්තුගත සාමාන්‍ය දෛනික වියදම සහ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලසීමාව පිළිබඳව සිදු කෙරෙන සමීක්ෂණයේ වාර්තාව අනුව සංශෝධනය විය හැකිය.

**මූල්‍ය ලැබීම්**

**2015 ජනවාරි මාසයේ දී රජය විසින් ලබාගත් දිගුකාලීන ණය, 2014 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 112.2 ට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 57.7 ක් විය.** මේ අතර, 2015 මාර්තු මස 13 වන දින වන විට, ශුද්ධ පදනම මත රජයේ සුරැකුම්පත් වෙළඳපොළෙහි වූ රාජ්‍ය ආයෝජන එ.ජ.ඩොලර් මිලියන 12.8 ක ගෙවීම් ප්‍රමාණයක් වාර්තා කළේය. තවද, 2015 මාර්තු මස 13 වන දින වන විට කොළඹ කොටස් වෙළඳපොළෙහි ද්විතීයික වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජන එ.ජ.ඩොලර් මිලියන 19.6 ක ශුද්ධ ලැබීම් ප්‍රමාණයක් වාර්තා කළේය.

**ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය**

2015 ජනවාරි මාසයේ දී ගෙවුම් තුලනය, 2014 අනුරූප කාල පරිච්ඡේදයේ දී වාර්තා කළ එ.ජ.ඩොලර් මිලියන 732.9 ක අතිරික්තයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 696.5 ක හිඟයක් වාර්තා කරනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

**ජාත්‍යන්තර සංචිත**

**එ.ජ.ඩොලර් මිලියන 930 ක විදේශීය ණය සේවාකරණ ගෙවීම් (ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සමීපස්ථ ණය පහසුකම සඳහා වූ ගෙවීම් සහ ස්වෛරීත්ව බැඳුම්කර පියවීම ද ඇතුළුව) හමුවේ වුවද, 2015 පෙබරවාරි මස අග වනවිට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් බිලියන 7.4 ක් විය.** දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 4.5 කට සමාන විය. මේ අතර, 2015 ජනවාරි මස අග වනවිට දළ නිල සංචිත සහ තැන්පතු භාර ගන්නා ආයතනවල විදේශීය වත්කම්වලින් සමන්විත මුළු විදේශීය වත්කම් එ.ජ.ඩොලර් බිලියන 8.9 ක් වූ අතර එය ආනයනික මාස 5.5 කට සමාන විය. දළ නිල සංචිත ප්‍රමාණය 2014 වසර අග වනවිට පැවති එ.ජ.ඩොලර් බිලියන 8.2 මට්ටමට වඩා අඩු වූ බැවින් රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව රටේ විදේශීය සංචිත ඉහළ නංවා ගැනීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීම්, ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර විදේශ විනිමය හුවමාරු ගිවිසුම් තුළින් ලැබීමට නියමිත එ.ජ.ඩොලර් බිලියන 1.5 ක ලැබීම් සහ අනෙකුත් අඛණ්ඩ ආයෝජන ලැබීම් මෙම ක්‍රියාමාර්ගයන්ගෙන් කිහිපයක් වන අතර ඒ තුළින් ඉදිරි මාස කිහිපය තුළ දී රටෙහි දළ නිල සංචිත ඉහළ මට්ටමකට වර්ධනය වනු ඇත.

**විනිමය අනුපාතිකයේ හැසිරීම**

**වත්මන් විදේශ විනිමය ප්‍රතිපත්තිය අනුව දේශීය විදේශීය විනිමය වෙළඳපොළට සාමාන්‍ය පරිදි මැදිහත්වීම තුළින් විනිමය අනුපාතිකයේ ස්ථාවරත්වය පවත්වා ගැනුණු අතර වසරේ මාර්තු මස 13 වන දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී එ.ජ.ඩොලරයට එරෙහිව රුපියල සියයට 1.39 කින් අවප්‍රමාණය විය.** කෙසේ නමුත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී විදේශ ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාතික හැසිරීම මත පදනම්ව ශ්‍රී ලංකා රුපියල යුරෝවලට එරෙහිව සියයට 13.1 කින් ද, ස්ටර්ලින් පවුමට එරෙහිව සියයට 3.2 කින් ද, ජපන් යෙන්වලට එරෙහිව සියයට 0.3 කින් ද, කැනේඩියානු ඩොලරයට එරෙහිව සියයට 8.2 කින් සහ ඕස්ට්‍රේලියානු ඩොලරයට එරෙහිව සියයට 5.2 කින් ද අධිප්‍රමාණය වූ අතර ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 2.7 කින් අවප්‍රමාණය විය.

.

**සංඛ්‍යා සටහන 3. විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශයක් (අ)**

| | 2014 ජනවාරි (එ.ජ.ඩො. මිලියන) | 2015 ජනවාරි (එ.ජ.ඩො. මිලියන) | වර්ධනය (සියයට) |
|---|---|---|---|
| අපනයන | 903.9 | 909.8 | 0.6 |
| ආනයන | 1,655.5 | 1,675.7 | 1.2 |
| වෙළඳ ශේෂය (අතිරික්තය (+)/ හිඟය (-)) | -751.5 | -765.9 | 2.7 |
| සංචාරක ඉපැයීම් | 233.3(ආ) | 248.7 | 6.6 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 555.5 | 523.5 | -5.8 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඇ) | 12.2 | 0.9 | -92.6 |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ඈ) | 1,375.1 | 147.6 | -89.3 |
| එයින්: | | | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 260.5 | 81.2 | -68.8 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 1,000.0 | - | - |
| දිගුකාලීන ණය | 112.2 | 57.7 | -48.6 |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) සංශෝධිත
(ඇ) ප්‍රාථමික සහ ද්විතියික වෙළෙඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.
(ඈ) රජය ලද ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර විකිණීමෙන් ලද ලැබීම්, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.